රෙජිස්ට්‍රාර්/අධ්‍යක්ෂ ජනරාල්:
பணிப்பாளர் நாயகம்/பதிவாளர் 011-2864483
Director Genaral/Registrar

අධ්‍යක්ෂ
பணிப்பாளர் 011-2888424
Director

සහකාර අධ්‍යක්ෂ
உதவி பணிப்பாளர் 011-2884612
Asst. Director

කාර්යාලය
அலுவலகம் 011 -2877376
Office

ෆැක්ස් :
தொலை நகல 011-2884612
Fax

මගේ අංකය
எனது இல. Vsso/Ngo/Mon/General
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி .07.2024
Date

29

මහජන ආරක්ෂක අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
**Ministry of Public Security**

**රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය - 14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.**
**அரச சார்பற்ற நிறுவனங்களின் தேசிய செயலகம் - 14ஆம் மாடி, சுகுறுபாய, பத்தரமுல்ல.**
**National Secretariat for Non-governmental Organizations - 14th Floor, Suhurupaya, Battaramulla.**
විද්‍යුත් තැපැල් மின் அஞ்சல் E-mail:ngosecretariat.gov@gmail.com

චක්‍රලේඛ අංක 10

සියළුම දිස්ත්‍රික් ලේකම්වරු වෙත,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත,
සියළුම දිස්ත්‍රික් රාජ්‍ය නොවන සම්බන්ධීකාරකවරු වෙත,

<u>ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන /රාජ්‍ය නොවන සංවිධාන අධීක්ෂණය සහ සුපරීක්ෂණය යටතේ විගණන වාර්තා ගෙන්වා ගැනීම සම්බන්ධවයි.</u>

ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන වල මූල්‍ය කටයුතු නිසි පරිදි විගණනය සිදු නොකරන බවට ඔවුන්ගේ සාමාජිකයන්ගෙන් හා විවිධ පාර්ශව වලින් දෛනිකව ලැබෙන පැමිණිලි සංඛ්‍යාව ඉහළ යාම හේතුවෙන් එම සංවිධානවල විගණනය විධිමත් කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතෙහි 9 වගන්තියෙහි රෙජිස්ට්‍රාර්වරයාගේ බලතල යටතේ (ඇ) උප වගන්තියේ පහත පරිදි සඳහන්ව ඇත.

**'සෑම අවුරුද්දකටම යටත් පිරිසෙයින් එක් වරක්වත් නියමිත ආකාරයට ඒ සංවිධානයේ ගිණුම් විගණනය කිරීම හෝ විගණනය කිරීමට සැලැස්වීම'**

03.ඒ අනුව, පහත සඳහන් ආකාරයට වාර්ෂික විගණන ක්‍රියාවලිය විධිමත් කිරීම හා වාර්තා ලබා ගැනීම බලාත්මක කළ යුතුය.

**අ. ජාතික මට්ටමින් ලියාපදිංචිය ලබා ඇති සංවිධාන**

ජාතික මට්ටමින් ලියාපදිංචිය ලබා ඇති සියලුම සංවිධාන වල ගිණුම් වාර්තා **පිළිගත් විගණන ආයතනයක්** මගින් විගණනය කර අදාල **විගණන වාර්තාව** මූල්‍ය වර්ෂය අවසන් වී මාස 2ක් ඇතුලත රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය වෙත ලබා දිය යුතුය.

**ආ. දිස්ත්‍රික් මට්ටමින් ලියාපදිංචිය ලබා ඇති සංවිධාන**

දිස්ත්‍රික් මට්ටමින් ලියාපදිංචිය ලබා ඇති සියලුම සංවිධාන වල වාර්ෂික ගිණුම් වාර්තා මහ සභා රැස්වීමකදී පත්කර ගනු ලබන **විගණන කමිටුවක් හෝ ගිණුම් පරීක්ෂකයකු** විසින් විගණනය කර මූල්‍ය වර්ෂය අවසන් වී මසක් ඇතුලත අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දිය යුතුය.

**ඇ. ප්‍රාදේශීය මට්ටමින් ලියා පදිංචිය ලබා ඇති සංවිධාන**

ප්‍රාදේශීය මට්ටමින් ලියාපදිංචිය ලබා ඇති සියලුම සංවිධාන වල වාර්ෂික ගිණුම් වාර්තා මහ සභා රැස්වීමකදී පත්කර ගනු ලබන **විගණන කමිටුවක් හෝ ගිණුම් පරීක්ෂකයකු** විසින් විගණනය කර විගණන වර්ෂය අවසන් වී මසක් ඇතුලත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දිය යුතුය.

04. ඉහත කරුණු වලට අමතරව සියලුම සංවිධාන විසින් පහත සඳහන් ලේඛණද පවත්වාගෙන යා යුතු බවට අංක 1101/14 හා 1999 ඔක්තෝබර් මස 15 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන්ව ඇත.

- බැංකු ගිණුම් ඇතුළත් මුදල් පොත
- අත් මුදල් පොත
- ප්‍රධාන ලෙජරය
- ප්‍රධාන ජර්නලය
- සාමාජික ගාස්තු ලෙජරය
- ණය කරුවන්ගේ සහ ණය හිමියන්ගේ ලෙජරය
- උප පත්‍රිකා පොත්
- කුවිතාන්සි නිකුත් කිරීමේ ලේඛනය
- වත්කම් ලේඛනය
- කාරක සභා වාර්තා පොත්
- සාමාජික ලේඛණය
- පත්වීම් ලිපි ඇතුළුව සාමාජිකයන්ගේ කාර්ය මණ්ඩලයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ විස්තර
- අදාළ පනත් සහ නියෝග ඇතුළත් ලිපි ගොනු

ඒ අනුව, ගැසට් නිවේදනය ප්‍රකාරව ඉහත ලේඛණ පවත්වාගෙන යාමට උපදෙස් ලබා දිය යුතුය.

05. මෙම චක්‍රලේඛයේ 03 හි (අ) (ආ) (ඇ) ඡේද අනුව සියලුම ලියාපදිංචි සංවිධාන විසින් අදාල කාල රාමුව තුල වාර්ෂික විගණන ක්‍රියාවලිය සිදුකිරීම හා වාර්තා ලබා දීමට දැනුවත් කළ යුතු වේ.

සංජීව විමලගුණරත්න
අධ්‍යක්ෂ ජනරාල්/ලේඛකාධිකාරි

පිටපත - සියලුම ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන